මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு

පොදු කාර්යාලය :011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
General Office
ෆැක්ස්/தொலைநகல்/Fax:011-2868426
Web: www.elections.gov.lk e-mail: info@slelections.gov.lk

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය(10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய(10107)

මගේ අංකය : EDR/LB/2024/01/A-401 ඔබේ අංකය : දිනය : 2024.05.07
எனது இல. : உமது இல.: திகதி :

සමන් ඒකනායක මහතා,
ජනාධිපති ලේකම්,
ජනාධිපති ලේකම් කාර්යාලය,
ගාලු මුවදොර,
කොළඹ 01.

**පළාත් පාලන බලප්‍රදේශ සඳහා ප්‍රජා උපදේශක කමිටු පත්කිරීම**

පළාත් පාලන බලප්‍රදේශ සඳහා ප්‍රජා උපදේශක කමිටු පත්කිරීම මැයෙන් ඔබ විසින් පළාත් ආණ්ඩුකාරවරුන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් අමතන ලද 2024.04.29 දිනැති අංක PS/SB/Circular/5/2024 දරන චක්‍රලේඛය හා බැඳේ.

02. මෙම චක්‍රලේඛය මගින් උරුමය ඉඩම් හිමිකාරිත්වය වැඩසටහන, නාගරික නිවාස හිමිකාරිත්ව වැඩසටහන, කඳුකර දශකයේ සංවර්ධන වැඩසටහන, කෘෂිකර්ම නවීකරණ වැඩසටහන හා සහල් බෙදා දීමේ වැඩසටහන ග්‍රාමීය මට්ටමින් අධීක්ෂණ කිරීම සඳහාත්, පළාත් පාලන ආයතන මට්ටමින් කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු ප්‍රමුඛ වැඩසටහන් හා ව්‍යාපෘති හඳුනා ගෙන එම වැඩසටහන් හා ව්‍යාපෘති අදාළ පළාත් පාලන ආයතන හරහා ක්‍රියාත්මක කිරීම සඳහාත්, ප්‍රජා උපදේශක කමිටු පත්කිරීමට අදාළ උපදෙස් ලබා දී ඇත.

03. වර්තමානයේ රට තුළ පවතින ආර්ථික හා සමාජමය ගැටළු වලට විසඳුමක් වශයෙන් මෙවැනි සුබසාධන හා සංවර්ධන ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ විරුද්ධත්වයක් නොමැත.

04. නමුත් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා නාමයෝජනා කැඳවා ඇතත්, තවමත් එම ඡන්ද විමසීම පවත්වා අවසන් නොමැත. එබැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ඒ වගන්තිය ප්‍රකාරව මැතිවරණ නීතිය තවමත් බලාත්මකව පවතී. එසේම පළාත් පාලන මැතිවරණ නීතිය බලපවත්වන කාල සීමාව තුළ කිසිඳු දේශපාලන පක්ෂයක්/ කණ්ඩායමක්/ අපේක්ෂකයෙක් ප්‍රවර්ධනයක් නොවන සේ කටයුතු කළ යුතු බවට හා ඒ සඳහා කිසිඳු රාජ්‍ය දේපලක් යොදා නොගත යුතු බවට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ.(4)(අ) අනුව්‍යවස්ථාව අනුව සියලු රාජ්‍ය ආයතන ප්‍රධානීන් දැනුම්වත් කරමින් 2023.01.04 දිනැති අංක 2313/32 දරන විධාන ගැසට් පත්‍රය හා 2023.01.05 දිනැති චක්‍රලේඛ අංක 20 මගින් මැතිවරණ කොමිෂන් නියෝග නිකුත් කර ඇති අතර එම ගැසට් නිවේදන හා චක්‍රලේඛ මැතිවරණ නීතිය බලාත්මක බැවින් තවදුරටත් ක්‍රියාත්මකව පවතී. (ඔබගේ පහසු පරිශීලනය සඳහා එම විධාන හා චක්‍රලේඛ පිටපත් මේ සමඟ ඉදිරිපත් කරමි.)

05. එමෙන්ම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා නාමයෝජනා භාර දී ඇති අපේක්ෂකයන් යෝජිත ප්‍රජා උපදේශක කමිටුවල සාමාජිකයින් ලෙස පත් කරන්නේ නම් ඔවුන් විසින් මෙම පත් කිරීම් සහ ලබා දෙන ප්‍රතිපාදන ස්වකීය දේශපාලන ප්‍රවර්ධනය උදෙසා යොදා ගැනීම නොවැළැක්විය හැකි වන්නාසේ ම එය පළාත් පාලන ආයතන ඡන්ද විමසීම ආඥා පනතේ (262 අධිකාරය) 82(ආ) යටතේ

සංග්‍රහ කිරීම, 82ඇ යටතේ අයුතු බලපෑම, 82ඇ යටතේ අල්ලස් ලබා දීම යන වරදවලට හේතු වේ. එසේම එම පනතේ දණ්ඩන නියමයන්ට මෙන්ම 9 වන වගන්තිය ප්‍රකාරව සභික ධුරය අහෝසිවීමට ද මෙය හේතු විය හැකි ය.

06. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 (3) අනුව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම පැවැත්වීම සඳහා ඡන්ද විමසීම් දින ප්‍රකාශ කිරීම තව නොබෝ දිනකින් සිදුවනු ඇත.

07. ඉහත සියළු කාරණා සලකා බැලීමේදී ඔබ විසින් ඉදිරිපත් කරන ලද චක්‍රලේඛය මගින් මැතිවරණ නිතීය බලාත්මක කාලය තුළ යම් යම් දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන් ප්‍රවර්ධනය වීමක් සිදුවන බව පැහැදිලිය. එසේ වුවහොත් මැතිවරණ නිතීය ක්‍රියාත්මක වීම කෙරෙහි මහජනතාවගේ විශ්වාසය බිඳ වැටීමක් ද සිදුවිය හැක. එසේම දැනට පළාත් පාලන ආයතන ක්‍රියාත්මක නොවන බැවින් හා නාමයෝජනා භාරදුන් අපේක්ෂකයන් මහජන නියෝජිතයින් නොවන බැවින්, හැකි ඉක්මණින් පළාත් පාලන මැතිවරණය පවත්වා විධිමත් මහජන නියෝජනයකින් මෙම කටයුතු සිදු කිරීම සුදුසු බව යෝජනා කරමි.

08. එබැවින්, ඉහත චක්‍රලේඛය මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන් හා සුභසාධන වැඩසටහන් දීප ව්‍යාප්ත පුළුල් වැඩසටහන් වන බැවින්, එය පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා නාමයෝජනා භාර දී ඇති කිසිදු අපේක්ෂකයෙක් සහභාගි කර ගැනීමකින් තොරව දිස්ත්‍රික් ලේකම්වරුන්/ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ අධීක්ෂණයෙන් සහභාගිත්වයෙන් ක්‍රියාත්මක කිරීම හා එවැනි කාර්යයන් සඳහා පත්කර ඇති රාජ්‍ය නිලධාරීන් මගින් සිදු කිරීම යෝග්‍ය බව කාරුණිකව දන්වන අතර, මේ පිළිබඳව අදාළ පාර්ශ්ව දැනුම්වත් කිරීමට කටයුතු කරන මෙන් වැඩිදුරටත් ඉල්ලා සිටිමි.

නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා ඔබගෙන් ලැබෙන සහාය බෙහෙවින් අගය කරමි.

6/5/7

ආර්.එම්.ඒ.එල්. රත්නායක
සභාපති
මැතිවරණ කොමිෂන් සභාව
මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි
ඊ/ල

පිටපත්:-

01. අග්‍රාමාත්‍ය ලේකම් - දැ.ගැ.සඳහා හා කරු.ගරු අග්‍රාමාත්‍යවරයා දැනුවත් කිරීම පිණිස

02. සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් - දැ.ගැ.සඳහා හා අවශ්‍ය කටයුතු සඳහා

03. සියළුම පළාත් ආණ්ඩුකාර ලේකම්වරුන් - දැ.ගැ.සඳහා හා කරු.ගරු ආණ්ඩුකාරවරුන් දැනුවත් කිරීම පිණිස

04. ලේකම් රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - (දැ.ගැ.සඳහා හා රාජ්‍ය පාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ විෂය භාර ඇමතිතුමන්ලා දැනුවත් කිරීමට)

05. දිස්ත්‍රික් ලේකම්වරුන්

06. ප්‍රාදේශිය ලේකම්වරුන්

07. සියළුම පළාත් පාලන කොමසාරිස්වරු

(05–07) කාරුණික දැනගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා